**රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I ශ්‍රේණියේ ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුර**

ඉහත තනතුරට පත් කිරීම සඳහා ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I ශ්‍රේණියේ සුදුසුකම් ලත් නිලධාරීන්ගෙන් (අයදුම්පත් කැඳවීම අවසන් වන දිනට I ශ්‍රේණියට උසස් කිරීමට සුදුසුකම් සපුරා ඇති අය ද ඇතුළුව) අයදුම්පත් කැඳවනු ලැබේ. පුරප්පාඩු සංඛ්‍යාව 03 කි.

ගණකාධිකාරී සේවයේ I ශ්‍රේණියේ අයදුම්කරුවන් නොමැති විට, එම ශ්‍රේණියේ වසර 03 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සපුරා ඇති අදාල සේවයේ II ශ්‍රේණියේ නිලධාරීන් තනතුරේ පූර්ණ කාලීනව රාජකාරි ඉටුකිරීමට පත්කිරීම සඳහා සලකා බලනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 135 හි විධිවිධානවලට යටත්ව පසුව තවදුරටත් දීර්ඝ කිරීමේ හැකියාව ඇතිව රාජකාරි ඉටුකිරීම සඳහා වන පත්වීම් උපරිම වසරක කාලයක් සඳහා සිදු කෙරේ.

අයදුම්කරුවන් විසින් ***මෙහි අමුණා ඇති ආකෘතිය භාවිතා කොට*** නිසි පරිදි සම්පූර්ණ කරන ජීව දත්ත තොරතුරු 2023.07.10 දින හෝ ඊට පෙර ලැබෙන පරිදි ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය, “නිල මැදුර”, ඇල්විටිගල මාවත, කොළඹ 05 යන ලිපිනය වෙත තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

ප්‍රමාද වූ අයදුම්පත්, අසම්පූර්ණ අයදුම්පත් සහ නියමිත ආකෘතියෙන් ඉදිරිපත් නොකරන ලද අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

2.0. අපේක්ෂක තොරතුරු

2.1.පළපුරුද්ද සහ වෘත්තීය සුදුසුකම්;

i. ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I ශ්‍රේණියේ අවම වශයෙන් වසර 03 ක පළපුරුද්දක් තිබීම වඩාත් සුදුසුය.
ii. ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ හෝ අභ්‍යන්තර විගණන ව්‍යවස්ථාවේ (මෙහි මින් මතුවට "සේවා ව්‍යවස්ථාව" ලෙස හැඳින්වේ) 5 වන පරිශිෂ්ටයෙහි නිශ්චිතව දක්වා ඇති ඕනෑම ක්ෂේත්‍රයක පශ්චාත් උපාධි/වෘත්තීය සුදුසුකම්
iii. ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය
iv. අභ්‍යන්තර විගණනය පිළිබඳ පුහුණුව අමතර වාසියක් වනු ඇත

2.2. ශක්තීන්

i. පීඩනය යටතේ වුවද, සෑම අවස්ථාවකදීම ස්වයං දැනුවත්ව සහ තමාගේ සාරධර්ම හා විශ්වාසයන්ට අනුවම කටයුතු කිරීම

ii. පවතින හොඳම සාක්ෂි මත පදනම්ව තීරණ දැනුම් දීම සඳහා තොරතුරු ගවේශනය සහ විශ්ලේෂණය කිරීමට ඇති හැකියාව

iii. කිසියම් අවදානමක් හෝ ගැටළුවක් ඇතිවීමට පෙර ඒවා අපේක්ෂා කිරීමට, හඳුනා ගැනීමට සහ ඒවාට විසඳුම් සෙවීමට කල්තියා සිතීමේ හැකියාව

2.3. චර්යාත්මක නිපුණතා

i. පවතින අවස්ථාව සමස්තයක් ලෙස දැකීමේ හැකියාව

ii එක්ව වැඩ කිරීම

iii. සන්නිවේදන හැකියාව

3.0. තෝරා ගැනීමේ ක්‍රමවේදය

ජීව දත්ත තොරතුරු සහ සම්මුඛ පරීක්ෂණය හරහා යෝග්‍යත්වය සහ කුසලතා ඇගයීම මත තෝරා ගැනීම පදනම් වේ. සම්මුඛ පරීක්ෂණය සඳහා කෙටි ලැයිස්තුගත අයදුම්කරුවන් සංඛ්‍යාවක් පමණක් කැඳවනු ලැබේ. අයදුම්පත් කෙටි ලැයිස්තුගත කිරීම සඳහා වන නිර්ණායකය සඳහා කරුණාකර 2022.09.15 දිනැති රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2022 හි 6 (ආ) වගන්තිය වෙත යොමු වන්න.

3.1 ලකුණු දීමේ පරිපාටිය

| ශීර්ෂය | උපරිම ලකුණු | ඇගයීම් ක්‍රමවේදය |
|---|---|---|
| **යෝග්‍යත්වය**<br>යෝග්‍යතම අයදුම්කරුට උපරිම ලකුණු ප්‍රදානය කෙරේ<br>ඊට සමානුපාතිකව අනෙකුත් අයදුම්කරුවන්ට යෝග්‍යත්වය සඳහා ලකුණු ලබා දෙනු ඇත. | 50 | ජීව දත්ත තොරතුරු |
| ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I ශ්‍රේණියේ පළපුරුද්ද**<br>ක්ෂේත්‍රයේ සේවා කාලය/විෂය කටයුතු පිළිබඳ පළපුරුද්ද හැරුණු විට, ඉහත ක්ෂේත්‍රයන්හි පළපුරුද්ද තුළින් ලබාගත් දැනුම,ප්‍රවීණත්වය තක්සේරු කරනු ලැබේ. | 20 | |
| **වෘත්තීය සුදුසුකම්**<br>(1). සේවා ව්‍යවස්ථාවේ 05 වන පරිශිෂ්ටයෙහි දක්වා ඇති ඕනෑම ක්ෂේත්‍රයක අභ්‍යන්තර විගණනය/විගණනය පිළිබඳ පශ්චාත් උපාධි/වෘත්තීය සුදුසුකම්<br>අ. පර්යේෂණ පදනම් වූ පශ්චාත් උපාධි- ලකුණු 7<br>ආ. අධ්‍යායන පශ්චාත් උපාධිය/සේවා ව්‍යවස්ථාවේ පරිශිෂ්ටයෙ 5.1 හි නිශ්චිතව දක්වා ඇති ඕනෑම වෘත්තීය ආයතනයක සාමාජිකත්වය - ලකුණු 6<br>ඇ. පශ්චාත් උපාධි ඩිප්ලෝමා- ලකුණු 5<br>ඈ. උපාධි/ පශ්චාත් උපාධි සහතික පත්‍ර- ලකුණු 4<br>ඉ. ඩිප්ලොමා- ලකුණු 3<br>(2) මූල්‍ය කළමනාකරණය පිළිබඳ හෝ විගණනය/අභ්‍යන්තර විගණනය පිළිබඳ පුහුණුව (උපරිම ලකුණු 1.0 දක්වා)<br>අ. මාස 3 ක් හෝ ඊට වැඩි කාලසීමාවක් සඳහා - ලකණු 1<br>ආ. දින 10 ක් හෝ ඊට වැඩි කාලසීමාවක් සඳහා - ලකණු 0.5<br>ඇ. දින 03 ක් හෝ ඊට වැඩි කාලසීමාවක් සඳහා - ලකණු 0.2<br><br>(3) ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය*<br>අ.පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ රජයේ පුහුණු ආයතනයකින් ලබාගත් ඉංග්‍රීසි ඩිප්ලෝමාව | 10 | |

| | | |
|---|---|---|
| /IELTS අධ්‍යයන සමස්ත ලකුණු 6.5 හෝ ඊට වැඩි, TOEFL-IBT 79 හෝ ඉහත, TOEFL-CBT 213 හෝ ඊට වැඩි, හෝ TOEFL-PBT 550 හෝ ඊට වැඩි- ලකුණු 02<br>ආ. පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ රජයේ පුහුණු ආයතනයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබාගත් සහතිකය - ලකුණු 01<br>* ලකුණු ප්‍රදානය කරනු ලබන්නේ ඉහළම සුදුසුකම් සඳහා පමණි. | | |
| ශක්තීන් **<br>ඉහත 2.2 හි දක්වා ඇති පරිදි අපේක්ෂකයින් අභිප්‍රේරණය වන අයුරින් කාර්යයන් ඵලදායී ලෙස ඉටු කිරීම | 10 | සම්මුඛ පරීක්ෂණය |
| චර්යාත්මක නිපුණතා**<br>ඉහත 2.3 වගන්තියේ දක්වා ඇති පරිදි ඵලදායී ලෙස සිදු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග සහ ක්‍රියාකාරකම්. | 10 | |
| **ප්‍රශ්න පත්‍ර ආකෘති සහ ශ්‍රේණිගත කිරීමේ පරිමාණයන් සඳහා කරුණාකර රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2022 හි ඇමුණුම II වෙත යොමු වන්න. | | |

සටහන 1: ඉහත ලකුණු දීමේ පරිපාටියේ "පිළිගත් විශ්වවිද්‍යාලය" යන්නෙන් අදහස් වන්නේ ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක් යන්නයි.

සටහන2: ඉහත ලකුණු දීමේ පරිපාටියේ දක්වා ඇති සියලුම පශ්චාත් උපාධි/වෘත්තීය සුදුසුකම්;

i. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් (අනෙකුත් උපාධි ප්‍රදානය කරන ආයතනවලින් ලබා ගන්නා එවැනි සුදුසුකම් සඳහා එම කොමිෂන් සභාව පිළිගෙන තිබිය යුතුය) හෝ

ii. රජයේ පුහුණු ආයතනයකින් හෝ රජයේ පිළිගත් විදේශීය අධ්‍යාපන ආයතනයකින්

ලබා තිබිය යුතුය;

කේ.ජී. ධර්මතිලක
අතිරේක ලේකම් (ස්වදේශ කටයුතු)
දිනය : 2023 ජුනි මස 22 වන දින

අත්/කළේ - කේ.ඩී.එන්.රංජිත් අසෝක
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය